**අවසාන වාර පරීක්ෂණය - 2017**
**ක්‍රිස්තියානි ධර්මය**
**11 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**

## I කොටස

01. (1) කාන්තාවන් ය.
02. (1) සෙකරියස් පූජක තුමා ය.
03. (3) බෙත්ලෙහෙම ය.
04. (4) පාස්කු මංගල්‍යය
05. (2) දේව රාජ්‍යයට නුසුදුසු ගුණාංග
06. (3) ලෙවීවරු ය.
07. (3) ජුදෙව්වන් අතරින් ය.
08. (4) සද්දුසිවරු ය.
09. (2) කුණාටුව නිශ්චල කිරීමේ සිද්ධිය
10. (3) පේදුරු තුමා
11. (1) අරිමාතියේ ජෝසෙප් ය.
12. (4) ක්ලෙයොපස් තුමා ය.
13. (2) ජනතා උද්ඝෝෂණය ප්‍රබල වූ බැවිනි.
14. (4) මෝසෙස් සහ එලියා
15. (1) ඉතා සුළුවෙන් ආරම්භ වී අති විශාල වර්ධනයක් කරා ගමන් කරයි.
16. (2) ඩුනොමීස්
17. (3) නායින් නුවර වැන්දඹුවගේ පුත්‍රයා මරණින් නැගිටුවීම
18. (1) පරිසිවරයෙකුගේ නිවසේ භෝජන සංග්‍රහයකට සහභාගි වූ අවස්ථාවේ දී ය.
19. (1) ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණය හඳුන්වන නම ය.
20. (4) ආත්මාර්ථය නසා දේව කැමැත්තට ඉඩ දීම ය.
21. (1) ඒවා දේව කැමැත්ත ඉටු කිරීමේ බලාපොරොත්තු වූ නිසා
22. (3) එලියා
23. (4) ජෙරමියා දිවැසිවරයා
24. (4) කැපවීමෙන් යුතුව රැළ පෝෂණය කිරීම
25. (1) දෙවිඳුන්ට හා අවශ්‍යතා ඇති අයට ප්‍රේම කිරීමෙන් ය.
26. (3) ජීවමාන ජේසුතුමා ගැන සාක්ෂි දැරීම හා ඉගැන්වීම
27. (3) ග්‍රීක වැන්දඹුවන් නොසලකා හැරීම පිළිබඳ පැමිණිලි
28. (2) මන්ත්‍රණ සභාවෙන් අවසර නොලැබුවද දේශනා කළ අවස්ථාව
29. (3) තාර්සස්
30. (2) සිරියාවේ අන්තියෝකියේ දී ය.
31. (1) අනනියස්ට
32. (3) ජොහාන් මාක් තුමා
33. (2) නිකදේමුස්
34. (3) ඒව
35. (1) ක්‍රිස්තුන් වහන්සේ හා සභාව අතර ඇති ප්‍රේමයට ය.
36. (2) දිළිඳුකම අභියෝගයක් ලෙස භාරගත යුතුය.
37. (2) යෙසායා ය.
38. (4) සමාරියේ ධනවතුන්ගේ භාර්යාවන්
39. (2) මීකා ය.
40. (3) ඇදහිල්ලෙන් සාක්ෂි දැරීම ය.

## II පත්‍රය

01. (i) ආලේප ලත් තැනැන් වහන්සේ
(ii) ස්නාවක ජොහාන් තුමා
(iii) දිනාර් හෙවත් රිදී කාසි
(iv) අබ ඇටය, මුහුන්
(v) ජේසුස් වහන්සේගේ නැවත පැමිණීම
(vi) මෙසියස් වහන්සේගේ රාජ්‍යයේ යුක්තිය හා ධර්මිෂ්ඨකම ඇති බව / බලාපොරොත්තු ඉටු වීම තුළ අසීමිත ප්‍රීතියක් හිමිවන බව
(vii) ප්‍රේමය
(viii) ස්තේපන්
(ix) මයිකල් ලාප්ස්ලේ පියතුමා
(x) මත්ද්‍රව්‍ය (ලකුණු 2X10=20)

02. (i) ජේසුස් වහන්සේ විසින් තම මෑණියන්ට / ජේසුස් වහන්සේ තම දෙමාපියන් සමග පාස්කු මංගල්‍ය සැමරීමට ජෙරුසලමට ගොස් ආපසු එන ගමනේ දී එතුමා නොසිටි බැවින් සොයාගෙන පැමිණි අවස්ථාවේ දී (ලකුණු 02)
(ii) චර්මඡේදනය, කැප කිරීම, අවුරුදු 12 දී දේව මාලිගාවට යාම (ලකුණු 03)
(iii) චර්මඡේදනය - ඉශ්‍රායෙල්වරුන්ගේ ආදි පිතෘ ආබ්‍රහම් හා ඔහුගෙන් පැවත එන මතු පරපුරට දෙවියන් වහන්සේ විසින් ලබා දුන් නියෝගයකි. මේ තුළින් දෙවියන්ට සන්තක වීමේ තත්ත්වයට ඇතුළු වේ. එම අදහස ප්‍රකාශ කිරීමේ බාහිර සංකේතය චර්මඡේදනය යි.

කැප කිරීම - මිසරයේ වහල්ලුන්ව සිට ඉන් මිදී මිසර දේශයෙන් පිටවූ රාත්‍රීයේ දී ඉශ්‍රායෙල් ජනතාවගේ කුළුදුලන් දෙවියන් වහන්සේ විනාශ නොකර ආරක්ෂා කළ බැවින් එම රැකවරණය සිහි කිරීමකි.

අවුරුදු 12 වයසේ දී දේව මාලිගාවට යාම - ජුදෙව් සමාජයේ පිරිමි දරුවන් වයස අවුරුදු 12 දී වැඩිහිටියන් ලෙසට පිළිගනු ලැබේ. එවිට ඔවුන් දේව මාලිගාවට ගෙන එනු ලබන අතර, ජුදෙව් ව්‍යවස්ථාව හෙවත් ටෝරාව ඉගෙන ගැනීමට අවස්ථාව ලැබේ. ඒ සඳහා ඔවුන් දේව මාලිගාවේ පෙනී සිටිය යුතු වේ. (ලකුණු 05)

03. (i) පරිසිවරු, සද්දුසිවරු (ලකුණු 02)
(ii) පව්කරුවන් ඇසුරු කිරීම පිළිබඳ අභියෝගය
සබත් දින සුව කිරීම පිළිබඳ අභියෝගය
පුනර්ජීවනය පිළිබඳ ප්‍රශ්නය (ලකුණු 03)
(iii) නොමග ගිය අය ඇසුරු කරමින් ඔවුන් යහමගට ගැනීමේ වැදගත්කම
නීතියට වඩා මිනිස්කම උතුම් බව පිළිගැනීම
සබත් දිනයේ පවා යහපතට නැඹුරු වීම
සමාජයේ කොන්වූවන්ට දයානුකම්පාව දැක්වීම
පුනර්ජීවනය ඇති බවත් ඒ සඳහා වරම ලබා ගැනීමේ වැදගත්කම (ලකුණු 05)

04. (i) කුරුසියේ දී තමන්ට පීඩා කළ අයට කමා දීම, ජුදයින්ට සමාව දීම (ලකුණු 02)
(ii) කමාව දීමට ක්‍රියා කළ යුතු බව , කමාව දේව ගුණාංගයක් බව, කමාව දීම හා කමාව ලැබීමේ හුරුවන අප දේව කැමැත්ත ඉටු කරන බව (ලකුණු 03)
(iii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

05. (i) එක්සත්ව එක්සිත්ව සිටීම, නොකඩවා යාච්ඤාවේ නිරත වීම (ලකුණු 02)
(ii) ස්තේපන්, පිලිප්, ප්‍රොකොරස්, නිකනොර්, තීමොන්, නිකලොස් (ලකුණු 03)
(iii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

06. (i) සමිඳාණන් වහන්සේ අපට කමා කළාක් මෙන් අපට එකිනෙකාට කමා වීම
වචනයෙන් හෝ ක්‍රියාවෙන් කුමක් කළත් එය ස්වාමින් වහන්සේගේ නාමයෙන් කරමින් දෙවිඳුන්ට ස්තුති කිරීම (ලකුණු 02)
(ii) ක්‍රිස්තුන් වහන්සේට ඇති ගෞරවය නිසා භාර්යාව හා ස්වාමිපුරුෂයා එකිනෙකාට යටත්ව ප්‍රේමයෙන් ජීවිත විය යුතුය. දරුවන් තම දෙමාපියන්ට කීකරු විය යුතුය, මවටත් පියාටත් ගෞරව කළ යුතුය (ලකුණු 03)
(iii) ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

07. ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 5X2=10)